# සෞඛ්‍ය අමාත්‍යාංශය / සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සඳහා සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීම 2024 - විවෘත

සෞඛ්‍ය අමාත්‍යාංශය/සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනවල සෞඛ්‍ය රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබාගන්නා ලද කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

| | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | මාර්ග නීති / මෝටර් කාර්මික දැනුම | 100 | 40% |
| | ප්‍රථමාධාර/රෝගී සත්කාර හා ප්‍රවාහන සේවා | 100 | 40% |
| වෘත්තීය පරීක්ෂණය | රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණය | 100 | 40% |

2. අවශ්‍ය සුදුසුකම් :-

| | |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස(සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම |
| වෘත්තීය සුදුසුකම් | 1 A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත) |
| පළපුරුද්ද | 1 A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත) අවම වශයෙන් වසර 05 ක රියදුරු තනතුරක සේවා පළපුරුද්දක් තිබිය යුතුය (සහතික මගින් සනාථ කළ යුතුය) |
| කායික සුදුසුකම් | I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>II. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.<br>III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමානවල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධයෙන් ලංකා අක්ෂි වෛද්‍ය සංගමය විසින් පිළිගත් නිර්ණායක වන වම් ඇස හා දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.<br>ආ). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේ අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය. |
| වෙනත් | I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. තම පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව චරිත සහතිකයක් හා ප්‍රදේශයේ (පූජ්‍ය පක්ෂය ඇතුළුව) පිළිගත් ප්‍රභුවරයෙකු ඇතුළුව චරිත සහතික 02 ක්<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |

3. සේවයේ නියුක්ත කරවීමේ හා සේවා කොන්දේසි :-

i. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
ii. මෙම පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට අයත්ය.
iii. වසර 3ක් ඇතුලත පළමු කාර්යක්ෂමතා විභාගය සමත්විය යුතුය.
iv. මෙම පත්වීම රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වේ.
v. බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උදාවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

4. වයස් සීමාව :-
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :-
මෙම තනතුරට රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (PL - 03 2006 A)

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6. අපේක්ෂකයින් තෝරාගැනීම හා අනන්‍යතාවය :-
සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් 2024.03.28 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (ප්‍රවාහන)
සෞඛ්‍ය අමාත්‍යාංශය
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

8. අයදුම් කළ යුතු ක්‍රමය :-

i. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.
ii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස "සෞඛ්‍ය රියදුරු III වන ශ්‍රේණිය (විවෘත) බඳවාගැනීම - 2024" ලෙස සඳහන් කළ යුතුය.
iii. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු / සමාදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරී නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 273,060.60 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කල යුතුය.
iv. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

v. විවෘත අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තුව රු. 1,000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රෝබේන් ශාඛාවේ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය නමින් ඇති ගිණුම් අංක 7040244 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි අංක 07 යටතේ ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ )

9. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :-
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවාගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගවලට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

වෛද්‍ය පී.ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය